ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு சக்தி அதிகாரசபை
Sri Lanka Sustainable Energy Authority
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ව්‍යවස්ථාපිත අධිකාරියකි
மின்வலு மற்றும் மீள்புத்தாக்க சக்தி அமைச்சின் நியதிச்சட்ட அதிகாரசபை
A Statutory Authority of Ministry of Power & Renewable Energy

**විදුලිය නාස්තිය අවම කිරීම සඳහා පියවර**

විදේශ විනිමය හිඟය කරණකොට පැන නැඟී ඇති ඉන්ධන සැපයීමේ ගැටළු හේතුවෙන් රටේ විදුලි සැපයුම දැඩි ලෙස අඩාල වී ඇත. පසුගිය මාස දෙක තුළ අඛණ්ඩ විදුලි සැපයුමක් පවත්වාගෙන යාම අභියෝගයක් බවට පත් වීම හේතුවෙන් ජනතාව දැඩි දුෂ්කරතාවලට ලක් වීම මෙන්ම නිෂ්පාදන කර්මාන්ත හා සේවා අංශවලට ද දැඩි පහරක් එල්ල වූයේ රටේ ආර්ථික තත්ත්වය තවදුරටත් උග්‍ර කරමිනි.

කෙසේ වෙතත්, උපරිම විදුලි ඉල්ලුම පවතින කාල සීමාව වන පැය 1800-2100 අතරතුරදී පවා වෙළඳ ආයතන විසින් වෙළඳ දැන්වීම් සඳහා මෙන්ම ගොඩනැගිලි අලංකරණ කටයුතු සඳහා විදුලිය භාවිතා කරන බව නිරීක්ෂණය වේ. මෙම ක්‍රියාවන්ට සියළුම සංඥා පුවරු ආලෝකමත් කිරීම, මුද්‍රිත දැන්වීම් පුවරු සඳහා ධාරා ආලෝක (Flood lighting) පහන් භාවිතය, ඩිජිටල් දැන්වීම් පුවරු සහ ගොඩනැගිලි මුහුණත් අලංකරණය සඳහා වන ආලෝකකරණය ආදිය ඇතුළත් වේ. ආලෝකකරණ උපකරණ විකුණනු ලබන බොහෝ වෙළෙඳ සල් හිමියන්ද සිය ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමේ උපක්‍රමයක් ලෙස ඔවුන්ගේ ප්‍රදර්ශනාගාර විදුලි පහන් විශාල සංඛ්‍යාවක් මඟින් ආලෝකමත් කර ඇත. එමෙන්ම බොහෝ ආගමික සිද්ධස්ථානවල ද විදුලි පහන් විශාල ප්‍රමාණයක් යොදා ගනිමින් ගොඩනැගිලි සහ ආශ්‍රිත එළිමහන් පරිශ්‍රයන් ආලෝකමත් කිරීම අඛණ්ඩව සිදුවන බව නිරීක්ෂණය වේ. ඇතැම් අවස්ථාවල මුළු රාත්‍රි කාලය පුරාවටම මෙම විදුලි නාස්තිය සිදුවේ.

කෙසේ වෙතත් විදුලි සැපයුමේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගන්නා තුරු මෙම බලශක්ති වැයවීම සීමා කිරීම අත්‍යවශ්‍ය වී ඇත. ඒ අනුව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම මඟින් විදුලි කප්පාදුව අවම කිරීමට මෙන්ම ඉදිරියටත් විදුලි සැපයුම පවත්වා ගැනීමට උපකාර වනු ඇත.

1. සංඥා පුවරු, නියොන් සහ LED සංඥා, ඩිජිටල් සහ මුද්‍රිත දැන්වීම් පුවරු ආලෝකමත් කිරීමට ජාතික විදුලි පද්ධතියෙන් සපයනු ලබන විදුලිය භාවිතා කිරීමෙන් වැළැකීම;
2. ආරක්ෂක කටයුතු සඳහා වන ආලෝකකරණය හැරුණු කොට ගොඩනැගිලි මුහුණත් ආලෝකමත් කිරීම සහ අන් සියළු ආකාර ආලෝකකරණ කටයුතු සඳහා ජාතික විදුලි පද්ධතියෙන් සපයනු ලබන විදුලිය භාවිතා කිරීමෙන් වැළැකීම.

මෙම මාර්ගෝපදේශය පිළිපදිමින් මේ දුෂ්කර අවස්ථාවේ ජාතික ධනය සුරැකීමට උත්සුක වන ලෙස උදක්ම ඉල්ලා සිටිමි.

**සභාපති**
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2022 මැයි 17 දින

අංක 05 ගොඩනැගිල්ල, පළමු මහල, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
5ஆம் கட்டிடம், முதலாம் மாடி, BMICH, பௌத்தாலோக்க மாவத்தை, கொழும்பு 07, இலங்கை.
Block 5, 1st Floor, BMICH, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka.

| කාර්යාලය அலுவலகம் Office | දුරලිපිය தொலைநகல Facsimile | විද්‍යුත්තැපෑල மின்னஞ்சல் E- mail | වෙබ් අඩවිය இணையம் Web Site |
|---|---|---|---|
| +94(0)11 267 7445 | +94(0)11 268 2534 | info@energy.gov.lk | www.energy.gov.lk |